
කරුණාරත්න අබේසේකර ශූරීන්ගේ 25 වන ගුණානුස්මරණය වෙනුවෙනි

# එදා ගුවනින් රටක් නැළැවූ රටක් හැඬවූ ක ට හ ඬ

*ඇස රැඳුණ රැඳුණ තැන්වල*
*මුව මඬල හිනැහුණා*
*ඔබ මතක නැති කරන්නට*
*මට මතක නැතිවුණා*



දැනට වසර විසිපහකට පෙර එනම් **1983** අප්‍රේල් මස **20** වෙනි දින අළුයම ශ්‍රීලංකාව පුරා විහිදී විසිරී සිටින ඉමහත් රසික ශ්‍රාවක ජනතාවක් සංවේගයට පත්කරමින් කරුණාරත්න අබේසේකර මහතා අභාවප්‍රාප්ත වීය. එතුමන් රචනා කළ එකල නිතර වාදනය වුණු ඉහත සඳහන් ගී පද අද දින ද මා සිහියට නැගුණේ වසර විසිපහක් ගෙවුණ ද අබේසේකර මහතා තවම අප කිසිවෙකුට මතක නැතිකරන්නට බැරි වූ බැවිනි. මා දිගු කලක් ඔවුන් ඇසුරු කළ බැවින් ඔවුන්ගේ හැසිරීම, කතා බහ, සිනහව මෙන්ම වේදිකාවේ හෝ ගුවන් විදුලි මැදිරියක මයික්‍රොපෝනයක් ඉදිරිපිට සරල, සුගම වචන උසුරුවමින් කථනයෙහි යෙදුණු ආකාරය ද දැනුදු මට මැවී පෙනේ.

කවියෙකු, ගී පද නිබන්ධකයෙකු, ගුවන්විදුලි ශිල්පි යෙකු, චිත්‍රපට දෙබස් රචකයෙකු, විස්තර කථක යෙකු ආදී සංනිවේදනයේ විවිධ මංතල ඔස්සේ පියනැගූ කරු ඒ හැම අංශයකදීම සිටියේ සෙසු අයට වඩා ඉතා ඉදිරියෙනි. හැටේ දශකයේ සිට මිය යනතුරාම ඔවුන්ගේ හඬ ගුවන් විදුලියට නැතිවම බැරි වීය. ඔවුන් නිසා ගුවන් විදුලිය ද, ගුවන් විදුලිය නිසා ඔවුන් ද ලාංකික ජනතාවට වඩාත් සමීප වූ බව සත්‍යයකි.

දැන් මෙන් රූපවාහිනී ලංකාවට නොතිබුණු ඒ සමයේ ලංකාවේ සිදුවූ වැදගත් සිදුවීම් හැටේ හැත්තෑවේ යුගයේ රටපුරා ජනතාව ගුවන් විදුලි මාධ්‍ය තුළින් ඇසූයේ බොහෝ විට කරුණාරත්න අබේසේකරයන්ගේ හඬිනි. නිදහස් උත්සවය, නුවර පෙරහැර හෝ විශේෂ රාජ්‍ය අමුත්තෙකුගේ පැමිණීම ඔහු ඉතා විචිත්‍රව සජීවීව විස්තර කළේ ය. එමෙන්ම **1959** දී අගමැති බණ්ඩාරනායක මහතාගේ අවමඟුල පිළිබඳව කථන යෙහි යෙදී කරු මුළු මහත් ලංකාවම හැඬවූයේ ය.

කරුණාරත්න අබේසේකරයන්ගේ ගීත මෙන්ම ඔවුන් දෙබස් ලියූ චිත්‍රපට ද බෙහෙවින් ජනප්‍රිය වීය. ටයිටස් තොටවත්ත නිර්මාණය කළ **චණ්ඩියා** චිත්‍රපටය එයට හොඳම නිදසුනයි. දහස් ගණනක් වන ඔවුන් රචනා කළ චිත්‍රපට හා සරළ ගීත ජනප්‍රිය වූවාසේම ඒවා ගැයූ ගායක ගායිකාවෝ ද ජනාදරයට පාත්‍ර වූහ. එදා තුරුණු වියේ සිටි, අද මැදි වයසේ පසුවන බොහෝ ශ්‍රාවක ජනතාවගේ සිත් හි රැඳී පවතින ජනප්‍රිය ගීත වැඩිමනක් කරු ලියූ ගීතයන් ය. අද මෙන් නොව එදා හින්දි ගී තාලවලට සිංහල වචන දැමිය යුතුව තිබුණි. එය කිසිසේත් පහසු කාර්‍යයක් නොවීය. තාල යට ගැලපෙනවාක් මෙන්ම, ගී පදය අර්ථවත් විය යුතු ය. එකල බොහෝ ලාංකික සංගීතඥවරුද මුලින් තනුව නිර්මාණය කර එයට වචන යොදන ලෙස රචක යාට කීහ. දැන් මෙන් රචකයා ලියා දුන් පද වැලට තනුව යොදන සිරිතක් ඒ කාලයේ නොවුණි. තනුවට වචන යොදන්නට ගොස් බොහෝ රචකයන්ට සුදුසු වචන නැතිව හිරවුණි. එහෙත් එය ඉතා ලෙහෙසියෙන් මෙන්ම, ක්ෂණිකව කළේ කරුණාරත්න අබේසේකරයන් පමණි. එසේ කියන්නේ ඔහු ඒ ආකාරයට ගීත ලියූ අවස්ථා කීපයකම මා ද බලා සිටි නිසා ය.

**1971** දී ටයිටස් තොටවත්ත (ටයි මහත්තෙයා) අධ්‍යක්ෂණය කළ **සිහසුන** චිත්‍රපටය මගේ සිහියට නැගේ. එහි සංගීත අධ්‍යක්ෂක නැසීගිය සෝමදාස ඇල්විටිගලය. චිත්‍රපටයට ම වූයේ ගීත තුනකි. ඇල්විටිගල මාස්ටර් ගීත දෙකක සංගීතය හා තනු ද නිර්මාණය කරගෙන ටයිටස්ගේ ගෙදරට පැමිණියේය. කරුණාරත්න අබේසේකරයන් ද ගීත ලිවීමට එහි පැමිණියේය. මාස්ටර් සර්පිනාවෙන් ගීයේ තනුව වාදනය කර පෙන්වීය. සිහසුන චිත්‍රපටයේ එම ජවනිකාව වූයේ අභිෂේක ලබමින් සිංහාසනාරූඪ වන රජතුමාට පුරෝහිතයන් විසින් ස්තෝත්‍ර ගයනු ලැබීමයි. සර්පිනාවේ වාදනය වන හඬ අසමින් කරු අයියා පැනෙන් කොළයක යමක් කුරුටු ගෑවේය. ඊට ගතවූයේ විනාඩි පහක් හෝ හයක් පමණි. ඔහු එසේ ක්ෂණිකව ලියා නිම කළේ පහත සඳහන් ගීයයි.

*සව්සිරින් සරු සාර වේ - මංගලම් ජය මංගලම්*
*සම්පතින් පරිපූර්ණ වේ - මංගලම් සුබ මංගලම්*

*රන්වන් සළුපිළි බඳෙහි එතේවා*
*රන්මුතු ඇමිණී ගෙලෙහි රැඳේවා*
*සන්සුන් සහනය ළඟා කෙරේවා*
*ආසිරි චාමර පවන් සැලේවා!*

ගායක ෂෙල්ටන් පෙරේරා ගැයූ .සිහසුනේ. මෙම ගීයට මම තවමත් ආශා කරමි. එම චිත්‍රපටයට තවත් ගීයක් ඉහතකී ආකාරයෙන්ම ක්ෂණිකව අබේසේකරයෝ ලියූහ. චිත්‍රපටයේ ඉතිරි ගීතය ලියන්නට ලැබුණේ මට ය. එකල ගීත රචනයෙහි ආධුනිකයෙකුව සිටි මට ඒ ගීය ලිවීම සඳහා දවස් එක හමාරක් ගත වූ බව මම නොසඟවා කියමි.


මම ලන්ඩනයට එන්නට වසර කීපයකට පෙර කරුණාරත්න අබේසේකර මහතා සමග චිත්‍රපට හා ගුවන් විදුලි ප්‍රචාරක කටයුතුවල නියැලුනෙමි. චිත්‍රපටවල හඬ කැවීමට ද, වෙසක් තොරන් වල ජාතක කතා ඇතුළුව නානා මාදිලියේ හඬ පටිගත කිරීම් වලට ද සහභාගි වුනෙමි. ඔහුගේ ජීවිතයේ බොහෝ පුද්ගලික දේ ද මා හා පවසා ඇත. ඒ සැබෑ හිතවතෙකු ලෙස ඔවුන් මා පිළිගත් නිසා ය.

අබේසේකරයන් මෙන් ඉතා පිරිසිදුවට හැඩට හැන්ද පැළැන්ද ගුවන්විදුලි නිවේදකවරුන් මා දැක ඇත්තේ කලාතුරකිනි. මිනිසුන්ගේ, විශේෂයෙන් කාන්තාවන්ගේ සිත් ඇද ගන්නා වාම්, එහෙත් දිදුලන පෞරුෂ යක් ඔවුන් කෙරෙන් විද්‍යාමාන වීය. චතුර කථනයට හා ක්ෂණික හිටිවන කවියට එය ද එකතුවීම ඔවුන්ගේ ජනප්‍රියත්වයට හේතු වූ බව රහසක් නොවේ. ගුවන් විදුලි මාධ්‍යයට සරිලන කටහඬේ පැහැදිලි ව්‍යක්ත බවක් වර්තමානයේ සංනිවේදනයෙන් ඇසුණොත් ඒ ඉතා කලාතුරකිනි.

කරුණාරත්න අබේසේකර මහතා ගැන කියන්නට මෙවැනි කෙටි සටහනක් ප්‍රමාණවත් නොවේ. ඔවුන් අද සිටියේ නම් ශ්‍රීලංකා ගුවන්විදුලිය පමණක් නොව ලංකාවේ සමස්ත සංනිවේදන ක්ෂෙත්‍රය ම පරිහානියට පත්ව ඇති සැටි දැක දුක් වෙනවා නිසැකය. අද දවසේ ලංකා ගුවනින් ඇසෙන විකාර වාගාලාප ගැනත්, තම මව්බස හරිහැටි නොදන්නා, ඉස්කෝලෙක නොගිය, බාල අම්බරුවන් තෙපලන තුප්පහි ගුවන් විදුලි බාසාව අසා උන් සිංහල බස විනාස කරන හැටි ගැනත් කෝපයෙන් වියරුවෙනවා ද නිසැක ය.

ජන සංනිවේදනයට ආලෝක යක් වූ කරුණාරත්න අබේසේකර මහතා වැනි චතුර, බුහුටි මාධ්‍යවේදීන් ලංකා ගුවන ඇමතූ ඒ රේඩියෝ සිලෝන් යුගයේ රසිකයින් ශ්‍රාවකයින් ලෙසින් අප ද එහි සිටි බව මෙනෙහි කිරීමත් මෙම කටුක වර්තමානයේ සැබැවින්ම ප්‍රීතියට කරුණකි.


♦ දයා ආනන්ද



කරුණාරත්න අබේසේකරයන් ගීත රචනය සඳහා ලබා ඇති සරසවි, දීපසිකා ආදි සම්මාන විශාල ප්‍රමාණයකි. 1976 දි ඔහු චිත්‍රපට සීයකට ගීත රචනාකිරීම අගයමින් කොළඹ කලාකවය නම් සංස්කෘතික පර්ෂදය මගින් උපහාර උළෙලක් පවත්වා ඔහුට රත්‍රං නෙළුම් මලක් පරිත්‍යාග කරන ලදි. මේ එම උත්සවයේ දි ගත් ජායාරූපයකි. පින්තූරය මැද මල් මාලා සහිතව කරුද, වම් කෙළවර සිනමා නළු ඩොමී ජයවර්ධනද වෙති. කරු ළඟම උපැස් යුවලක් පැළඳ සිටින්නේ එවකට චිත්‍රපට සංස්ථාවේ සභාපති සරත් අමුණුගමය. (මේ ජායාරූපය අපට එව්වේ පුත්‍රයා වන දිලිප අබේසේකරය.)

***අතීතයේ ඉංග්‍රීසියෙන් පමණක් විකාශනය කළ ක්‍රිකට් විස්තර ප්‍රචාරය මුලින්ම ගුවනින් සිංහලෙන් සිංහළ අසන්නන්ගේ සවනට ගෙන ආ විස්තර කථක ලෙසද කරුණාරත්න අබේසේකරයන් ලංකා සංනිවේදන ඉතිහාසයට එක්වේ. ගම්බද පළාත්වලට ක්‍රිකට් ක්‍රීඩාවට ඇල්මක් උනන්දුවක් ඇතිවූයේ එදා ඔහුගේ ඒ විස්තර කථනයෙනි. ගුවන් විදුලියෙන් ක්‍රිකට් විස්තර සිංහලෙන් ප්‍රචාරය වන්නට වූයේ එතැන් සිට ය.***

**මේ කරු අයියා 1979 දි මට ලන්ඩනයට එවූ ගුවන් ලියුමක කොටසකි**


21. 9. 79
තෙරුවන් සරණයි
ආදරණීය දයා,
ඔබේ [illegible] ලියාන්විත ලිපිය ලැබී වැසි
[illegible] දුටු මොනරෙකු මෙන් අමන්දානන්දයට
පත්වුණා. තාමත් දිනකට දෙතුන්වර ඔබ ගේ
දක්ෂකම් සහ අවංකභාවය ගැන මා මෙහි
සේවය කරන අය සමග කෘතඥ පූර්වකව
මතක් කරනවා. දැන් මා උදේ පහට නැගිට රෑ





PLACE YOUR BUSINESS WITH CONFIDENCE...
A ROCK SOLID TRAVEL AGENT
PART OF THE MIKE COOKE GROUP

This New Year, make a fresh start, with Holiday Air

Colombo Return from...
KUWAIT AIRWAYS £330 + taxes
SriLankan £345 + taxes**
QATAR AIRWAYS £315 + taxes
Book on Sri Lankan Airlines and be eligible for a free flight to an Indian or Far Eastern Destination

A Free Money Transfer to Sri Lanka and Worldwide from Fastcash on every air ticket booked with Holiday Air!

MCG Strong Safe Reliable Mike Cooke Group
ATOL PROTECTED
IATA
020 8882 2626
www.holidayair.com
125-127 Bramley Road, Oakwood, London, N14 4UT

*Terms and Conditions Apply **Date-Specific Promotional Fare